රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99 (XXXIX)

මගේ අංකය : EST-6/05/TPR/1010-1
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.12.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්

රජයේ නිලධරයන්/ අධිකරණ නිලධරයන්/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධරයන්ට නිල ප්‍රවාහන පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කළ 2020.02.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXXVIII) තෙක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධිත 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 01 වගන්තියට පහත සඳහන් තනතුර ද ඇතුළත් කිරීමට සහ එහි 03 ඡේදයට 3.8 ලෙස පහත උප ඡේදය ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට 2020.10.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. (I) 1:1:1 (XXXII) මහා භාරකාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය මහා භාරකාර තනතුර.

(II) 3:8 මෙහි සංශෝධිත සියලුම චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බල සේනාවට අයත් නිලධරයකුට ද විශ්‍රාම ගැනීමේ දී තීරු බදු සහන සහිත වාහන ආනයන බලපත්‍රයක් ලබා දීම.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය